



# ග්‍රීක නාට්‍යයේ ආරම්භය 2



ශ්‍රීනාත් මද්දුමගේ

**ශතවර්ෂ** ගණනාවක් තිස්සේ ග්‍රීක නාට්‍ය රංග දක්වනු ලැබුවද දැනට අපට පරිශීලනය කිරීමට ඉතිරිව ඇත්තේ නාට්‍ය රචකයන් පස්දෙනෙකු ගේ නාට්‍ය කෘති පමණී. ඔවුන් නම් ඊස්කිලස්, සොෆොක්ලිස්, යුරිපිඩිස්, ඇරිස්ටොෆානිස්, මිනැන්ඩර් යන නාට්‍ය රචකයන් ය. මෙම රචකයන් විසින් ලියන ලද නාට්‍ය විශාල සංඛ්‍යාව අතරින් අද දක්නට ඉතිරිව ඇත්තේ නාට්‍ය 46 ක් පමණී. එම නාට්‍ය 46 න් 32 ක්ම ශෝකාන්ත නාට්‍ය ය. නාට්‍ය 12 ක් දුක්ඛාන්ත කාට්‍ය ය. දෙකක් සැටර් නම් නාට්‍ය විශේෂයට අයත් ය. මෙයින් 4 ක් හැර අන් සියල්ලම රචනා කරන ලද්දේ ක්‍රිපූ 5 වන සියවසේ දී ය.

දැනට අප අතට පත්ව ඇති පැරණිම නාට්‍යය ලෙස දක්නට ලැබෙන්නේ ඊස්කිලස් විසින් ක්‍රි පූ 525 රචනා කරන ලද නාට්‍යයයි. ඔහු නාට්‍ය 79ක් රචනා කර ඇති බැව් ඉතිහාසඥයන්ගේ මත අනුව දැනගන්නට ලැබුණ ද දැනට ඉතිරිව ඇත්තෙ කෘති 7 ක් පමණී. එම නාට්‍ය නම්

පර්සියන්වරු ක්‍රි පූ 472
තීබන් වරුන්ට එරෙහිව සතරදෙනක් ක්‍රි පූ 467 දී
ඇගමෙම්නන්, සොෆ්රෝ සහ යුම්නයිඩීස් යන නාට්‍ය ත්‍රිත්වය ක්‍රි පූ 458
අනුපූරකයෝ,
ප්‍රොමිතියස් බන්ධනය

ඉතිරිව ඇති නාට්‍ය යි.

මේ අතර පර්සියන්වරු නාට්‍යය අද්විතීය ස්ථානයකට පත්වෙයි. ඒ මන්දයත් ඓතිහාසික සිද්ධියක් මුල් කොටගෙන නාට්‍යය රචනා කර තිබීමයි. පර්සියානු යුද්ධය එයට වස්තු බීජය වී තිබේ. පුරාණොකත්ති වලට අමතරව ඓතිහාසික සිද්ධි වස්තු බීජ වූ නාට්‍ය තකවත් විශාල සංඛ්‍යාවක් ග්‍රීක නාට්‍ය කරුවන් අතින් බිහි වූ බව අප අමතක නොකළ "යුතු කරුණකි.



සොෆොක්ලිස් ගේ ඊඩිපස් නාට්‍යයේ සිංහල නිෂ්පාදනය
අතුල පීරිස් අධ්‍යක්ෂණය කළ මෙම නාට්‍යයේ ශ්‍රීනාත් මද්දුමගේ රඟපෑ දර්ශණයක්.
මෙහි රඟපෑම වෙනුවෙන් ජාතික රාජ්‍ය නාට්‍ය උළෙලේ රංගන කුසලතා සම්මානයක් ඔහුට හිමිවිය.

නාට්‍ය කලාවට ඊස්කිලස් කළ ප්‍රධානම සේවාව ලෙස විද්වතුන් පෙන්වා දෙන්නේ නාට්‍ය රංග භූමියට දෙවන නළුවකු රංගනයට සම්බන්ධ කිරීමයි. අප ගිය කලාපයේ පෙන්වා දුන් පරිදි ක්‍රි පූ 5 වන සියවස වන තෙක් එක නලුවකු පමණක් රඟපෑ අතර එනිසාම නාට්‍යය තුළ ගැටුමක් නිරූපණය නොවී ය. නමුත් ඊස්කිලස් මේ කරන ලද වෙනස නිසා මුහුණට මුහුණ ලා සිදුවන රංග ගැටුම් නිරූපණය කිරීමට හැකි විය. දැන් නළුවන් දෙනෙකු සිටින නිසා පෙර පරවති නාට්‍ය වල ගායක වෘන්දයේ වැඩි වැදගත්කමක් තිබුණත් මෙම නාට්‍ය වලට ගායක වෘන්දයේ ඇති වැදගත්කම අඩු විය. එමෙන්ම ඔරිස්ටියා නමින් හැඳින්වෙන ඊස්කිලස් ගේ තුන් ඈඳුතු නාට්‍යය විශ්ව නාට්‍ය කාලවේ මහඟු සිහිවටනයක් ලෙස සනිටුහන් වී ඇත. එනමුත් ශ්‍රේෂ්ඨතම ග්‍රීක නාට්‍ය රචකයා ලෙස ලෙස සැළකෙන්නේ සොෆොක්ලිස් (ක්‍රි පූ 496 සිට 406) ය.

ඔහු නාට්‍ය 100 කට වැඩි සංඛ්‍යාවක් රචනා කරන ලද නාට්‍ය රචකයෙකි. එනමුත් අපට දැකගන්නට අදට ඉතිරවී වි ඇත්ෙ ඊස්කිලස්ගේ මෙන්ම නාට්‍ය 7 ක් පමණි. ඒවා නම්

ඇජැක්ස්
ඇන්ටගනි
ඊඩිපස් රජ
ෆ්ලෝක්ටිස්
ඉලෙක්ට්‍රා
ට්‍රිපනි



යන නාට්‍ය වලට අමතරව අදින්නෝ නමැති සැටර් නාට්‍යයද රචනා කරන ලදී. මෙම සැටර් නාට්‍යයේ ද සෑහෙන කොටසක් අදටත් ඉතිරිව තිබේ.

සැටර් නාට්‍ය යනු හාසෝත්පාදක ලක්ෂණ සහිත නාට්‍ය වලට කියන විශේෂ නමකි. ඒවාට ඇතුළත් වූයේ හාස්‍යජනක ග්‍රීක පුරාණ කතා ය. මෙම නාට්‍ය "නැරඹීමෙන් ලිහිල් මානසික තත්වයකින් ප්‍රේක්ෂකාගාරයෙන් පිටවී යාමට හැකියාවක් තිබුණි. ඒ මන්දයත් ග්‍රීක නාට්‍ය විශාල සංඛයාවක් ශෝකාන්ත නාට්‍ය නිසා නරඹන්නා නාට්‍ය නැරඹීමෙන් කම්පනයට පත්වෙයි. මෙම කම්පනය නැති කිරීමට ප්‍රේක්ෂකයන් සැටර් නාට්‍ය නරඹා එයින් විනෝද වූහ.
ඊස්කිලස්ගේ හා සොෆොස්කිලස්ගේ නාට්‍ය විශාල සංඛ්‍යාවක් ලංකාවේ විවිධ අධක්ෂවරු විසින් රගගත කොට ඇත. මේ සියළු නාට්‍ය ශ්‍රී ලංකාවේ නාට්‍ය ප්‍රේක්ෂකයන් ඉතා ඕනෑ කමින් නැරඹූ බව අපට කිව හැකි ය.

### ග්‍රීක නාට්‍යයක දෙබස් කීපයක්

ඊඩිපස් නාට්‍යයෙන්

දුක් දොම්නසින් තොර ජීවිතයේ අවසන් ඉම
පනින තෙක් කිසිවකු
සුඛිත යයි නොම සිතිය යුතු වෙයි.

**ඊඩිපස්**
ඇපලෝ මයි මිතුරනි... මේ විපත සළසා දුක් ගෙන දුන්නේ එනමුත් මා
වෙත එල්ල කළේ දරුනු ප්‍රහාරය
අනි කිසිවතකු නොව මගේ හස්තයමයි සැකයක් නැත...

**පණිවිඩකරු**
තීබ පුරවර වැසියනි..
මේ පුවත අසනු මැනවි..
මේ පුවත මා ඔබට පවසමන්නේ කෙසේද?
මා දුටු දේ
අහෝ
අහෝ ඊඩිපස්
කුමක්ද ඔබට සිදුවූ සාපය..

මම කවුලු අතරින් දුටිමි.......